ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.03.05

පැමිණිලිකාර පාර්ශවය : එම්.ටී.සී.ඇලෙක්සැන්ඩර්
තමරිදු
දොඩම්පහළ
දික්වැල්ල

වගඋත්තරකරු : සභාපති
ජාතික තරුණ සේවා සභාව
අංක 65, හයිලෙවල් පාර,
මහරගම.

**පැමිණිලි අංකය: HRC/ 4751/22**

**පැමිණිල්ල මගින් ඉදිරිපත් කර සිටින කරුණු**

එම්.ටී.සී. ඇලෙක්සැන්ඩර් නැමැති පෙත්සම්කරු 2022.10.27 දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කරමින් දක්වා සිටින්නේ, තමන් මේ වන විටත් ජාතික තරුණ සේවා සභාවේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයට අනුයුක්තව MA 4 සේවා ගණයේ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියකු ලෙස සේවය කරන බවත්, 2001.10.18 දින ජාතික තරුණ සේවා සභාවේ සහකාර තරුණ සේවා නිලධාරියෙකු ලෙස මුල් පත්වීම ලැබ පසුව ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාත්මක කිරීමේ /උපදේශන සේවා ගණයේ ( MA 4) 111 ශ්‍රේණියේ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී තනතුරට අධි සේවක පදනම යටතේ 2015.02.01 දින උසස්වීම් ලද බවය. 2021.04.29 වන දින ජාතික තරුණ සේවා සභාවේ සහකාර අධ්‍යක්ෂක ධූරය සඳහා දිනමිණ පත්‍රයේ පුවත්පත් දැන්වීමක් හරහා අයදුම්පත් කැඳවා තිබූ බවත්, ඒ අනුව තමන් බාහිර අයදුම්කරුවෙකු ලෙස අයදුම්පත් යොමු කළ නමුත්, පුවත්පත් දැන්වීම් ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වුණු බවත් පෙත්සම්කරු වැඩිදුරටත් පවසයි.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දෙවන වරටත් මෙම සහකාර අධ්‍යක්ෂක ධූරය සඳහාම නැවතත් 2022.10.27 දිනට පෙර අභ්‍යන්තරව අයදුම්පත් කැඳවූ පසුව පෙත්සම්කරු ද නැවතත් මෙම තනතුර සඳහා අයදුම්පත් යොමු කර ඇත. එම අවස්ථා දෙකේදීම බාහිර හා අභ්‍යන්තර යනුවෙන් සේවා ගණ දෙකක් යටතේ තරුණ සේවා සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ප්‍රකාශයට පත් කරමින් අයදුම්පත් කැඳවා තිබුණු බවත් ඒ අනුව ජාතික තරුණ සේවා සභාවේ සේවය කරන ලද අභ්‍යන්තර සේවකයන් අතුරින් සමහර සේවකයන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සේවා ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට අයදුම්පත් යොමු කළ බවත් ඒ අනුව තමාද බාහිර සේවා ගණය යටතේ අයදුම්පත් යොමු කරන ලද බවත් පවසයි. මෙම අයදුම්පත් කැඳවන අවස්ථා දෙකෙහිදීම බාහිර අයදුම්කරුවන්ගේ සුදුසුකම් ලෙස උපාධිය සහ ක්ෂේත්‍රයේ වසරක පලපුරුද්ද සුදුසුකම් වශයෙන් දක්වා තිබූ බවත් තමන් එකී සුදුසුකම් සපුරා තිබූ බැවින් එලෙස අයදුම්පත් යොමු කල බවත් වැඩිදුරටත් පෙත්සම්කරු පවසයි.2022.10.30 දින සිට 2022.11.01 දින දක්වා පැවති සම්මුඛ පරීක්ෂණයට ආයතනයේ සේවය කරන බාහිර අයදුම්කරුවන්ගේ සේවා ගණය යටතේ සුදුසුකම් සම්පූර්ණ කර අයදුම්පත් යොමු කරන ලද අභ්‍යන්තර නිලධාරීන්ට කැඳවීම් ලැබී තිබූ නමුත් පෙත්සම්කරුට එලෙස සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් නොලද බව පවසයි.එලෙස සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබූ අභ්‍යන්තර නිලධාරීන් MA 3 සහ MA 4 සේවා ගණය යටතේ සේවය කරන සහකාර තරුණ සේවා නිලධාරින් වූ නමුත් , ඒ වන විටත් MA 4 සේවා ගණයේ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියකු ලෙස සේවය කළ තමාගේ අයදුම්පත මෙලෙස ප්‍රතික්ෂේප වූ බව පෙත්සම්කාර එම්.ටී.සී ඇලෙක්සෙන්ඩර් මහතා සිය පැමිණිල්ලේ දක්වා සිටියි. මීට හේතුව ජාතික තරුණ සේවා සභාවෙන් විමසූ අවස්ථාවේදී ජාතික තරුණ සේවා සභාව එයට හේතුව වාචිකව සඳහන් කරමින්, පෙත්සම්කරු MA 4 සේවා ගණයේ දිස්ත්‍රික් තරුණ සේවා නිළධාරී තනතුරට උසස්කර ඇත්තේ අධි සේවක පදනම යටතේ බැවින් සම්මුඛ පරීක්ෂණය සඳහා අවස්ථාව ලබා දිය නොහැකි බව ප්‍රකාශ කර ඇත.එහෙත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක හෝ ආයතන සංග්‍රයයේ හෝ වෙනත් කිසිදු ලේඛනගත නොවූ නීතියක් පදනම් කර ගනිමින් තමාහට උසස්වීමට ඇති අයිතිය අහිමි කර ඇති බවත් තමා උක්ත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවස්ථාව ඉල්ලා සිටින්නේ භාහිර අයදුම්කරුවන්ට වන සුදුසුකම් යටතේ බැවින්, එකී අවස්ථාව අහිමි කිරීම අසාධාරණ බවට පෙත්සම්කරු ප්‍රකාශ කර සිටියි.

එම අවස්ථා දෙකේදීම බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ප්‍රකාශයට පත් කරමින් අයදුම්පත් කැඳවා තිබුණු බවත් ඒ අනුව ජාතික තරුණ සේවා සභාවේ සේවය කරන ලද අභ්‍යන්තර සේවකයන් පවා බාහිර අයදුම්කරුවන් සඳහා වන සේවා ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට අයදුම්පත් යොමු කළ බවත් ඒ අනුව තමාද බාහිර සේවා ගණය යටතේ අයදුම්පත් යොමු කරන ලද බවත් පවසයි.2022.10.30 දින සිට 2022.11.01දින දක්වා පැවති සම්මුඛ පරීක්ෂණයට ආයතනයේ සේවය කරන බාහිර අයදුම්කරුවන්ගේ සේවා ගණය යටතේ සුදුසුකම් සම්පූර්ණ කර අයදුම්පත් යොමු කරන ලද අභ්‍යන්තර නිලධාරීන්ට කැඳවීම් ලැබී තිබූ බව පෙත්සම්කරු පවසයි.එලෙස සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබූ අභ්‍යන්තර නිලධාරීන් MA 3,4 ඒවා ගනිමින් සේවය කරන සහකාර තරුණ සේවා

නිලධාරීන් වූ නමුත් , ඒවන විටත් MA 4 සේවා ශ්‍රේණියේ දිස්ත්‍රික් තරුණ සේවානිලධාරියකු ලෙස සේවය කළ තමාට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොලැබුණු බවද පවසයි.

<u>වගඋත්තරකරුගේ ප්‍රකාශය</u>

මෙම පැමිණිලිකරුට දේශපාලන හේතූන් මත විවිධ ගැටලුවට මුහුණ දුන් අයට සහන සැලසීම යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2017.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2017.02.21 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය අනුව අධි සේවක පදනම යටතේ මෙම උසස් වීම් ලබා දී ඇත.මෙකී පත්වීම දේශපාලන පළිගැනීමක් ලෙස නිරීක්ෂණය නොවන නමුත් දීර්ඝ කාලයක් එකම තනතුරේ රාජකාරී කරමින් සිටින නිසා සහනයක් ලෙස පෙත්සම්කරුව 2015.02.01 දින සිට අධි සේවක පදනම මත දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී තනතුරට උසස්වීම් ලබා දුන් බව වගඋත්තරකාර පාර්ශවය පවසයි.

මෙම පැමිණිලිකරු විසින් සහකාර අධ්‍යක්ෂක ධුරය සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇතත් ,මොහු මීට පෙර දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙකු ලෙස අධි සේවක පදනම යටතේ උසස් වීම ලබා තිබීමහේතුවෙන් ,කළමනාකරණ අධ්‍යක්ෂක ජනරාල්ගේ 2019.09.17 හා 2022.09.30 දිනැති ලිපි අනුව ලබා දී ඇති උපදෙස් අනුව ඉහල තනතුරු සඳහා උසස් වීම් ලබා දීමට නොහැකි බැවින් පෙත්සම්කාර නිලධාරියා හට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොකළ බව වගඋත්තරකරු පවසයි.

පෙත්සම්කරු විසින්, 2024.05.20 දිනැති ලිපිය මගින් කොමිෂන් සභාවට යොමුකොට ඇති ලිඛිත නිරීක්ෂණයන්ට අනුව, ජාතික තරුණ සේවා සභාවේ සහකාර අධ්‍යක්ෂක තනතුර සඳහා ජනක ප්‍රභාත් හෙට්ටිආරච්චි හා සුජානි ප්‍රියන්තිකා මිය ඇතුළු තවත් අභ්‍යන්තර නිලධාරීන් පිරිසක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා තනතුරු ලබා දී ඇති බවත් ,එකී පිරිස දරන ලද තනතුර අනුව ඔවුන්ට බඳවා ගැනීමේ පටිපාටිය මගින් උසස්වීම් සඳහා ඉල්ලුම් කිරීමට හැකියාවක් නොමැත්තේ වුවද බාහිර සුදුසුකම් සම්පූර්ණ කිරීම තුළ ඔවුන් මෙලෙස බඳවා ගැනීමට කටයුතු කළ ඇති බවත්, මේ අනුව බඳවා ගැනීම පටිපාටිය අනුව උසස් වීමට අවස්ථාවක් නොමැති අධිසේවකයන්ට උක්ත සේවා කාණ්ඩය යටතේ සමාන සැලකීමක් නොකිරීම සම්බන්දව පෙත්සම්කරු නගන චෝදනාවට පිළිතුරු සපයමින් වගඋත්තරකරු පහත හේතු දක්වා සිටියි. ඒ අනුව, මෙහි ප්‍රශ්නගත තනතුරට පත් කරන ලද ජනක ප්‍රභාත් හෙට්ටිආරච්චි ,සුජානි ප්‍රියන්තිකා මිය ඇතුළු අනෙකුත් අභ්‍යන්තර නිලධාරීන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා ඇති බවත් උසස් වීම් ලබා දී ඇති බවත් පෙත්සම්කරුට පමණක් 2019.09.17 දිනැති ලිපි අනුව ලබාදී ඇති උපදෙස් අනුව උසස් වීම් ලබාදීමට නොහැකි බැවින් පෙත්සම්කාර නිලධාරියාව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නොකළ බව වගඋත්තරකරු පවසයි.

## නිරීක්ෂණ හා නිගමන

පැමිණිලිකරු වෙත ඔහුගේ පත්වීම් බලධාරියා වන වින්තිකාර පාර්ශවය එනම් ජාතික තරුණ සේවා සභාව විසින් ලබා දී ඇති 2017.03.24 දිනැති පත්වීම් ලිපියට අනුව, පෙත්සම්කරුට ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාත්මක කිරීමේ/උපදේශන සේවා ගණයේ MA 4 ශ්‍රේණිය දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරි තනතුර ලබා දී ඇත. උක්ත පත්වීම් ලිපියෙහි සඳහන් පරිදි, මෙම පත්වීම ලබා දී ඇත්තේ, දේශපාලන හේතු මත විවිධ ගැටලු වලට මුහුණ දුන් අයට සහන සැලසීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ 2017.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධයෙන් 2017.02.21 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයට අනුව බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් 2022.10.13 දින සිට 2022.10.27 අවසන් දින ලෙස සඳහන් කරමින් ජාතික තරුණ සේවා සභාව විසින් සහකාර අධ්‍යක්ෂක ධුරය(MM1-1) සඳහා සිදුකරන ලද අභ්‍යන්තරය අයදුම්පත් කැඳවීමේදී , පෙත්සම්කරු අයදුම්පත් ඉදිරිපත් කර ඇති බවට නිරීක්ෂණය වේ.

එම ප්‍රශ්නගත සහකාර අධ්‍යක්ෂක (MM1-1)තනතුරට සම්මුඛ පරීක්ෂණ කැඳවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර සේවකයන් වන එනම් , ජාතික තරුණ සේවා සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය වෙත ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂක ජෙනරාල් විසින් 20222.10.13 දිනැති ලිපියෙන් සිදු කරන ලද දැනුවත් කිරීම අනුව, 2021 වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂක තනතුරට අදාළව අයදුම්පත් කැඳවන ලද අවස්ථාවේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ සහ අලුතින් අයදුම්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැකි බවට සඳහන් කර ඇති බවත් එකී සහකාර අධ්‍යක්ෂක තනතුර සඳහා පුරප්පාඩු 36ක් ඇති බවත් නිරීක්ෂණය වේ.

එකී ලිපියෙහි ඇමුණුමෙහි දක්වා ඇති පරිදි ,මෙකී තනතුරට කාණ්ඩ දෙකක් යටතේ එනම්, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් යනුවෙන්,කනිෂ්ඨ කළමනාකරණ( JM 1-1) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර පහක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් යනුවෙන්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ඕනෑම උපාධියක් සහ උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසු රාජ්‍ය ආයතනයක සංස්ථාවක මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක පිළිගත් වාණිජ ආයතනයක තරුණ සේවා සංවර්ධනය ප්‍රජා සංවර්ධනය සමුපකාර කටයුතුයි ග්‍රාම සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසරක (01) පලපුරුද්ද ලබා තිබීම යනාදී සුදුසුකම් සඳහන් කර තිබේ. පෙත්සම්කරුට අදාළ ක්ෂේත්‍රය තුළ වසර 20 කට අධික පළපුරුද්ද මෙන්ම ශාස්ත්‍රපති උපාධියද සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය වන ජාතික තරුණ සේවා සභාවේ සභාපති/අධ්‍යක්ෂක ජනරාල් පැමිණිලිකරුව අදාළ සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමට හේතු දක්වමින් NYSC/ET/1(6)/අභ්‍යා: උසස්-2021 දාතමයෙන් යුතුව, 2021.11.09 දිනැති ලිපියක් නිකුත් කරමින් සඳහන් කර සිටින්නේ, අදාළ අධ්‍යක්ෂක ධුරයට

අභ්‍යන්තර උසස් වීම් ලබා ගැනීම සඳහා පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය,කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජනරාල්ගේ DMS/1671/V-3 හා 2019.09.17 දිනැති ලිපියේ අන්තර්ගතය කරුණු අනුව අධි සේවක පදනම් මත උසස් වීම් පෙත්සම්කරු හට ලබා දිය නොහැකි බැවින් ප්‍රතික්ෂේප කරන ලද බවයි.

මෙම වගඋත්තරකරු විසින් එවන ලද NYSC/ET/1(6)/අභ්‍ය: උසස්-2021 දාතමයෙන් යුතු ලිපියෙහි පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත කළමණාකාර (MM 1-1)සේවා ගණය සහකාර අධ්‍යක්ෂ තනතුරට අභ්‍යන්තර උසස්වීම් ලබා ගැනීම සඳහා යොමු කරන ලද්දක් ලෙස සඳහන් කර ඇත. නමුත් එකී අභ්‍යන්තර උසස් වීම් ලබාදීමේදී, අයදුම්පත් යොමු කළ හැකි කාණ්ඩ දෙකක් සඳහන් කර ඇති බවත්,ඉන් එකක් වන අභ්‍යන්තර පදනම යටතේ දැනටමත් කනිෂ්ඨ කළමනාකරණ (JM =1) සේවා ගණයේ සේවයේ නියුතු වූවන්ටද, දෙවැන්න මේ වන විටත් උපාධියක් ලබා එක් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කල යනාදී ලෙසත් සඳහන් කර ඇත.මින් බාහිර යන අයදුම්පත් යොමු කල හැකි දෙවන කාණ්ඩය යටතේ පෙත්සම්කරු සිය අයදුම්පත යොමු කොට ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම පෙත්සම්කරුගේ අයදුම්පත අභ්‍යන්තර උසස් වීමක් ලෙස දැක්වීම සාධාරණ නොවන බව නිරීක්ෂණය වේ.

පෙත්සම්කරුව අදාළ සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමට හේතු ලෙස පැමිණිලිකරු අධි සේවක පදනම් මත උසස් වීම් ලබා තිබීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා අධ්‍යක්ෂක ජෙනරාල්ගේ 2019.09.17 දිනැති ලිපිය දක්වා ඇත.එකී ලිපියෙහි දක්වා ඇත්තේ, දේශපාලන ගැටලු වලට මුහුණ දුන් අයට සහන සැලසීම යන මැයෙන් එවකට ජාතික ප්‍රතිපත්ති ආර්ථික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද අංක 17/0293/706/022 හා 2017.01.31 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා, 2017.02.21 දින ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ජාතික තරුණ සේවා සභාවේ නිලධාරීන් දාහතර දෙනකුට ඔවුන් ඉල්ලා ඇති තනතුරු වෙත අධි සේවක පදනම මත උසස්වීම් ලබාදුන් බවයි.

තවදුරටත් එකී ලිපියෙහි කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර සිටින්නේ, එලෙස උසස් වීම් ලදී නිලධාරීන් 14 දෙනා සම්බන්ධ ගැටලු දේශපාලන පළිගැනීමක් ලෙස නිරීක්ෂණ නොවන නමුත් දීර්ඝ කාලයක් එකම තනතුරේ රාජකාරි කරමින් සිටින නිසා සහනයක් ලෙස අධිසේවක පදනමෙන් උසස් කිරීමට යෝජනා කරමින් මෙකී උසස් කිරීම් පිළිබඳ කාරණාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් වී ඇති බවයි.

එකී අමාත්‍ය මණ්ඩලයේ තීරණය පරිදි ජාතික තරුණ සේවා සභාව විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයට අමුණා තිබූ ඇමුණුම් දෙකෙහි නම් සඳහන් නිලධාරීන්ට අධි සේවක පදනම් මත උසස් වීම් ලබාදිය නොහැකි බව නිරීක්ෂණය වන බව සඳහන් කරයි.

පෙත්සම්කරු මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත යොමුවී ඇති බවත්, මේ පිළිබඳව ඔම්බුඩ්ස්මන් කාර්යාලය වෙත ජාතික තරුණ සේවා සභාව විසින් යොමු කරන ලද ලිපිවලට අනුව පැහැදිලි වන්නේ, මුදල් අමාත්‍යාංශය මගින් ජාතික

අයවැය චක්‍රලේඛ 03/2022 හා 2022.04.26 දිනැති රාජ්‍ය වියදම් පාලනය කිරීම මැයෙන් ඉදිරිපත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය සේවය සඳහා බාහිරින් බඳවාගැනීම් සිදුකල නොහැකි බවයි.

එසේම, තවදුරටත් එකී ලිපියෙහි මෙම ප්‍රශ්නගත සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් අභියාචනා කමිටුවක් පිහිටුවා ඇති බවත්, එකී අභියාචනා කමිටුවට මෙම නිලධාරියා විසින් යොමු කළ අභියාචනය සලකා බැලීමෙන් අනතුරුව නැවත පෙත්සම්කරුව සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරවීමට නිර්දේශ කර ඇති අතර ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අදාළ කටයුතු මේ වන විටත් සම්පාදනය වෙමින් පවතින බවද 2024.01.01 ලිපිය මගින් ජාතික තරුණ සේවා සභාව කරුණු දක්වා ඇති බව නිරීක්ෂණය වේ.

මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් සිය තීරණය දක්වමින් ඔම්බුඩ්ස්මන් කාර්යාලය විසින් OMB/P/2/6/3605/2022 දාතමයෙන් යුත් ලිපියක් පෙත්සම්කරු වෙත ඉදිරිපත් කරමින්, අභියාචනා කමිටුව මගින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙත්සම්කරු ඉදිරිපත් කරවීමට නිර්දේශ කර ඇති බැවින් ඒ අනුව පෙත්සම්කරුගේ ගැටලුව සම්බන්ධයෙන් අදාළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතින බැවින් ගොනුවේ කටයුතු අවසන් කරන බව දක්වා ඇත. මේ අනුව වගඋත්තරකාර පාර්ශවය අභියාචනා කමිටු තීරණය පිළිබඳව 2024.04.15 දින කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයේදී කළ කරුණු දැක්වීම හා ඔම්බුඩ්ස්මන්වරයාට ඒ පිළිබඳව වාර්තා කිරීමේදී එකිනෙකට වෙනස් කරුණු ඉදිරිපත් කිරීමක් නිරීක්ෂණය වේ. අවසන් වශයෙන් 2025.08.22 දිනැතිව ඊව/1(6)/මානව හිමිකම් දාතමින් යුත් ලිපියක් මගින් කරුණු දක්වමින් ජාතික තරුණ සේවා සභාව ප්‍රකාශ කර සිටින්නේ, අයි සේවක පදනමෙන් උසස් වීම් ලබා ගත් නිලධාරීන් පිරිසක් ජාතික තරුණ සේවා සභාවේ සේවය කරන බවත් කළමණාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක - DMS/1671- V-II හා 2019.09.17 දිනැති ලිපිය අනුව පෙත්සම්කරු ඇතුලු අයිසේවක පදනමෙන් උසස්වීම් ලැබූ කිසිවෙකුටත් මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් නිකුත් නොකල බවයි. නමුත් පෙත්සම්කරු අයදුම් කර ඇත්තේ අභ්‍යන්තර කාර්යය මණ්ඩලයේ බාහිර කාණ්ඩය යටතේ බැවින්, වගඋත්තරකරු ඉදිරිපත් කරන මෙම කරුණු ප්‍රශ්නගත සිදුවීම සම්බන්ධයෙන් අදාළ නොවේ.

මුල් කාලීනව 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය සම්බන්ධයෙන් අධිකරණ පරිචය වූයේ, 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් ස්ථාපනය කිරීමට තමන් හා සමාන තත්ත්වයේ සිටින්නන් හා සසඳන විට තමන්ට අසමාන ලෙස සලකන බවට උදාහරණ දැක්වීමක් පෙත්සම්කාර පාර්ශවය විසින් සිදුකල යුතුය යනුවෙනි. ජයසිංහ එදිරිව. නීතිපති [ 2004] 1Sri LR 74 නඩුකරය තුළදී ප්‍රනාන්දු විනිසුරුතුමන් ප්‍රකාශ කර සිටින්නේ, " සමාන සැලකීමක් ප්‍රතික්ෂේප කිරීම ස්ථාපනය කිරීම සඳහා, අදාල තත්ත්වයන් යටතේ අනෙක් පුද්ගලයින් හා සමාන නොවන ලෙස සලකා ඇති බව ඔප්පු කිරීම අවශ්‍ය බවයි". ඒ අනුව ටී.එම්.සී ඇලෙක්සැන්ඩර් නැමති පෙත්සම්කරු, අයි සේවක පදනම දක්වමින් තමන්ට සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීමේ අවස්ථාව අහිමි කළද , බාහිර අයදුම්කරුවන් යන කාණ්ඩය යටතේ, (MA 3)සේවා ගණයේ සිටින තරුණ සේවා නිලධාරීන් හා ක්‍රියාත්මක කිරීමේ /උපදේශන සේවා ගණයේ (MA 4) සේවා ගණයේ උපදේශන නිලධාරීන්ට ද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී ඇති බවත් එතුලින් තමාට වෙනස් කොට සැලකීමක් සිදුකළ බවද ප්‍රකාශ කර සිටී.

ක්‍රියාත්මක කිරීමේ/උපදේශන සේවා ගණයේ (MA 4) සේවා ගණයේ උපදේශන නිලධාරීන්ට ආයතනය බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව උසස් වීමේ ක්‍රමවේදයක් සඳහන්ව නොමැති බවත්, එසේ තිබියදී ක්‍රියාත්මක කිරීමේ/උපදේශන සේවා ගණයේ නිලධාරීන් ලෙස කටයුතු කරන ජනක ප්‍රභාත් හෙට්ටිආරච්චි මහතා සහ සුජානි ප්‍රියන්තිකා මහත්මිය ඇතුළු නිලධාරීන් පිරිසකට සම්මුඛ පරීක්ෂණ ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දී ඇත්තේ මෙකී බාහිර අයදුම්කරුවන් යන කාණ්ඩය යටතේ සලකා බලමින් බවට පෙත්සම්කරු 2025.09.08 දින ලිපියක් මගින් වගඋත්තරකරුවන්ගේ ඊටී/1(6)/ මානව හිමිකම් යන 2025.08. 22 දිනැති ලිපියට ලිඛිතව විරෝධතා ගොනු කරමින් ප්‍රකාශ කර සිටියි.

ඒ අනුව වගඋත්තරකාර පරිපාලන ආයතනය වන ජාතික තරුණ සේවා සභාව විසින් අනුමත කාර්ය මණ්ඩයෙන් බැහැරව කැබිනට් මණ්ඩල නිර්දේශ ප්‍රකාරව සිදු කරන ලද අධි සේවකයින්ව බඳවා ගැනීමේ කාර්යපටිපාටිය අනුව ඔවුන්ට උසස්වීම් ලබාදීමේ හැකියාවක් නොමැති බවට සිදුකරන ප්‍රකාශය නිරවද්‍ය බව නිරීක්ෂණය වේ. තවදුරටත් පුවත්පත් දැන්වීමට අනුව මෙකී තනතුර බාහිර පදනමින් කැඳවූවක් විනා අධිසේවකයන් උසස් කිරීමක් පිලිබඳ තත්වයක් එහි නොමැති බව නිරීක්ෂණය වේ. එබැවින්, පෙත්සම්කරුගේ ඉල්ලුම්පත්‍රය ඉවත දමමින් ඔහුට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමට ඇති අවස්ථාව අහිමි කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනයක් වේ.

තවදුරටත් මෙහි බාහිර අපේක්ෂකයෙකුට ඇති සුදුසුකම් මත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේ නීත්‍යානුකූල අපේක්ෂාව කඩවීම කාර්යපටිපාටික නීත්‍යානුකූල අපේක්ෂාව (Procedural legitimate expectation ) කඩවීමක් ලෙස, සැලකිය හැක්කේ මෙම සිදුවීම තුළින් තරුණ සේවා සභාව විසින් ක්‍රියාත්මක කරන ලද බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය තුළින් එනම් පුවත්පත් දැන්වීම මගින් ප්‍රසිද්ධ කරන ලද නිසි ක්‍රියාවලිය ඔස්සේ උසස් තනතුරකට අයදුම් කිරීමට ඇති අයිතිය මත උද්ගත වන්නා වූ නීත්‍යානුකූල අපේක්ෂාව මෙහිදී පෙත්සම්කරු විෂයෙහි උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ.

වර්තමාන අධිකරණ පරිචය දෙස බැලීමේදී නිරීක්ෂණය වන්නේ, නීත්‍යානුකූල අපේක්ෂාව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව යටතේ එන සර්ව සාධාරණත්වයේ අයිතිය ක්‍රියාත්මක භාවයට පත්කරනු ලබන සංකල්පයක් ලෙස සලකන බවයි.(Choolanie vs Peoples Bank and others [1985] 1 Sri LR 1. ). ඒ අනුව මෙකී සිදුවීම තුළින්,වගඋත්තරකාර පාර්ශවය වන ජාතික තරුණ සේවා සභාව විසින් පෙත්සම්කරුට මෙම තනතුරට අයදුම් කිරීමේ නීත්‍යානුකූල අයිතිය උල්ලංඝනය කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) යටතේ දක්වා ඇති " නීතිය පසිදලීම, ක්‍රියාත්මක කිරීම සහ නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය " යන අයිතිවාසිකම පෙත්සම්කරු විෂයෙහි උල්ලංඝනය කොට ඇති බව නිගමනය කරමු.

ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) වගන්තිය පෙත්සම්කරු සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව නිගමනය කරමු.

## නිර්දේශ

1. මෙම තනතුර සම්බන්ධයෙන් අදාළ සම්මුඛ පරීක්ෂණ අවසන් වී ඇති බව වාර්තා වේ. එමෙන්ම වගඋත්තරකරු විසින් අදාළ තනතුර සම්බන්ධයෙන් නව සම්මුඛ පරීක්ෂණයක් කැඳවන බව ද කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත. එකී සම්මුඛ පරීක්ෂණයේ දී මෙම පෙත්සම්කරු සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ මෙම නිර්දේශයේ සඳහන් කරුණු ද සැලකිල්ලට ගනිමින් පැමිණිලිකරු සම්බන්ධව විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය.

2. අමාත්‍යාංශ ලේකම් විසින් ඉහතකී ක්‍රියාදාමය පිලිබඳ පරීක්ෂා කොට ඒ පිලිබඳ සුදුසු පියවර ගෙන කොමිෂන් සභාව වෙත 2026.04.28 දිනට පෙර වාර්තා කිරීමට කටයුතු කල යුතුවේ.

2026.04.28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, පැමිණිලිකරු විසින්ද නිර්දේශය ක්‍රියාත්මක ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදුනොකරන්නේ පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී දෙහිදෙණිය,
සභාපති,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් -:

1. අමාත්‍ය,
   තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය,
   09,පිලිප් ගුණවර්ධන මාවත,
   කොළඹ 07. - සුදුසු පියවර සඳහා

2. ලේකම්,
   තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය,
   09,පිලිප් ගුණවර්ධන මාවත,
   කොළඹ 07. - සුදුසු පියවර සඳහා